# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2016

### 2022 නොවැම්බර් - 2023 ජනවාරි

### මානවශාස්ත්‍ර පීඨය

### සිංහල (නව නිර්දේශය)

### අභිලේඛන, සංස්කෘතිය හා ජනශ්‍රැතිය SINH – E 3025

පළමුවන කොටසේ පළමු ප්‍රශ්නය හා තවත් එක් ප්‍රශ්නයක් ද, දෙවන හා තෙවන කොටස්වලින් අවම වශයෙන් එක් ප්‍රශ්නය බැගින් ද ඇතුළත් වන සේ ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

## 1 කොටස

01. අ. පහත සඳහන් ශිලා ලේඛන පාඨවල අදහස ලිහිල් බසින් ලියන්න.

පරුමක වෙලු පුතන ලෙණෙ අගත අනගත චතුදිශ ශගශ
අබයහ ලෙණෙ අගත අනගත චතුදිශ ශගශ

පරුමක උතර පුති පරුමක පුලයස බරිය උපශක උතිය
ලෙණෙ
බත ශොනහ ලෙණෙ අගතනගත ච(තු)(දි)ශ ශගශ නියතෙ

පරුමක නදික පුතශ පරුමක මිතශ ලෙණෙ අගත අනගත
චතුදිශ ශගශ දිනෙ

මතුල බගිනියන ලෙණෙ අගත අනගත චතුදිශ ශගශ නියත
ශෙ

උපරඣ නග පුතෙ රඣ අබයෙ නම තශ පුතෙ ගමණි
තිශෙ නම තෙන කරිතෙ ශුදශනෙ ශගශ

(දෙ)වනපිය මහරජහ ගාමිණි තිශහ පුත මහ තිශ අයහ
ලෙණෙ සගිකෙ

දෙවනපිය මහරඣහ ගමිණි තිශහ පුත මහ අයහ මහලෙණ
බත දමගුතහ ලෙණෙ අගත අනගත චතුදිශ ශගශ (ලකුණු 08)

ආ. දසඅමණක බයලිහි
වෙඩ අ
මණ දෙපෙකඩක බයලි ඉච / මෙවතක චනහි ගහෙ
කිණිය චිටවය වෙ
ඩ ගෙණ තිණඩහකට දනවට ඉච අතරකජක වට ඉච
අතරකජ
(පරි)කර යපෙනි ඉච දි මියවට පෙණිතිල ඉච බුනතෙල්
ඉච ලොණ ඉච
පලහවට ඉච වෙටයල ඉච වහෙර ......ග සර ප ......පවනහි
මිලිය පදිය ඉච / මෙව (තක) වෙඩවතක ගෙණ චනය
චනය
අතොවසහි නිකමනිය වද පුණමස දොළසපක දිවස
(අ)රියවස කරන මහබිකුසගහට නියත කොටු යහිසපව
(ත න)
ච වහෙරකහි දිනි/ (ලකුණු 08)

ඈ.	ඈතිනකර මඟුල් මහවෙයා දකුණ්දොර් අසන්හි රජ්වෙද්හල්
කරය් රොච්බියසමය් පොදොනවුලු පුලුඬාවුලුයෙන් කෙත්කම්
සුලබ් කොට් සිරිලක් ළොනුර්වය් සාබිය නි
වය් රට්සොයය් සැත්බිය නෙර නන්ජැයින් නන්සෙය්
බුද්බන්ද්කරය් සියල් ඉසිරයෙන් පූජය් දා සැණෙ
න් බුද්රුවන් අරියය් ධමුරුවන් කවරි සෙයෙකින් පූජනෙමි
හො යන අදහස් පූරය් අභිධම්දෙසුන් කසුන්
පත් අරවය් මහපූජා කොට් සසුන් සිට්වමි යන සිත්දොල්නෙන්
ඈජර පය හමුයෙහි එ මෙ ධම් දෙසුන් වියක්
හන් කළ සියබස්නෙන් බුද්ගුණ වැනූ රිවි අන්වයෙන් බට්
සැහැකුලකොත් ඔකාරජකුලට් තලාටික් අප පුරුමු
වො තුමන් සත් ලැගු සවන හවුරුදුයෙහි අබහය්ගිරි වෙහෙර
කපාරාමුළට් සලමෙය්වන් පව් කරය් සඟුන්
වසවය් සතර පස සුලබ්කොට් මෙමෙ නකය් අබිදි අවසට්
මෙ සිරිත් තැබැවූහු (ලකුණු 08)

ඈ.	සිරිබර කැත් කු-
ල කොත් උකාවස්
රද් පරපුරෙන් බ-
ට් ලක්දිව් පොළො
යොන පරපුරෙන් හි
මි වූ එ මෙ කුලෙන් බ
ට් සමුදගොත් බිසො
රුදැනයා උපැදැ ඇපා ම
හයා සිරි විඳැ පිළිවෙළ
සෙ රුද පැමිණැ රුදැ කළ

සිරිසගබො උදා ම
හරදහු තුමා සත් ලැ-
ගු දෙවන හවුරුදු
යෙහි නිකිත්නි ස(ඳ)
අව විසෙනියි සොර
බරහි ආවූ හොපිටි
ගමුපදියා වැපාර(ය)
න් කුඩින් වත්හිමිය (න්)
වහන්සෙ මියුගුණුමහ-
වෙර වැඩි කලැ ගි
ය දවසැ පදිලද් ද
ඩනායකයන් ගැත්ත
න් සතළොසැ පිරිනිවි
යන්වහන්සෙ දවසැ
කළ වැවස්ථා ඉක්මැ අ-
න්නෑයෙන් දඩ ගත්හ (ලකුණු 08)

නැතහොත්









(ලකුණු 08)

02. ලාංකේය ලේඛන කලාවේ ආරම්භය පිළිබඳ විමසීමක් කරන්න.

03. තෝනිගල සෙල්ලිපියේ ඓතිහාසික අගය පිළිබඳ විවරණයක් කරන්න.

04. "පුරාණ ලංකාවේ පැවති අපරාධ මර්දන නීතිරීති පිළිබඳ වැදගත් ලේඛනයක් ලෙස වේවැල් කැටිය පුවරු ලිපිය හැඳින්විය හැකිය." විමසන්න.

## II කොටස

05. සංස්කෘතිය යනු කුමක්දැයි නිර්වචන ආශ්‍රයෙන් පැහැදිලි කොට, එහි පවතින භෞතික හා අභෞතික පාර්ශ්ව පිළිබඳ විග්‍රහයක් කරන්න.

06. උපසංස්කෘති බිහිවන්නේ කවර සාධක පදනම් කරගෙනදැයි යන්න කෙරෙහි විශේෂාවධානයක් යොමු කරමින් ඔබට අභිමත උපසංස්කෘතියක් පිළිබඳ විශ්ලේෂණයක් කරන්න.

07. ඓතිහාසික හා ජනප්‍රවාදමය මූලාශ්‍රය කෙරෙහි සාවධාන වෙමින් ලංකාවේ යක්ෂ ගෝත්‍රික සංස්කෘතිය පිළිබඳ සමාලෝචනයක් කරන්න.

නැතහොත්

පරිසරයත් මිනිසාත් සුරකිමින් සමාජ පැවැත්ම තහවුරු කළ පිළිවෙත් සමූහයක් වශයෙන් වැව් රාජකාරි සම්බන්ධ සංස්කෘතික වටිනාකම් ඇගයීමට ලක්කරන්න.

## III කොටස

08. සාම්ප්‍රදායික සිංහලයන්ගේ ජනජීවන වෘත්තීන් පිළිබඳව අධ්‍යයනය කිරීමෙහි ලා ජනකවියෙන් සැපයෙන පිටුබලය කෙබඳුදැයි සනිදර්ශනව පහදන්න.

09. "වෘක්ෂශ්‍රැතිය වනාහි පැරැන්නන්ගේ භෞතික හා අභෞතික ජීවිතය පිළිබඳ අධ්‍යයනය කළ හැකි ජනශ්‍රැති අංගයකි." මේ ප්‍රකාශයෙහි සත්‍යාසත්‍යතාව විභාග කරන්න.

10. සිංහලයන්ගේ ජනජීවිතය හා සතුන් අතර පවත්නා සබඳතාවෙහි විවිධ ස්වරූප ජනශ්‍රැතියෙහි කවරාකාරයෙන් සටහන් වී ඇත් දැයි නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

නැතහොත්

"නිමිති ශාස්ත්‍රය වූ කලී ශාස්ත්‍රීය පදනමකින් තොර මිථ්‍යා විශ්වාස පදනම් කරගත් අභිචාර විශේෂයකි." මේ ප්‍රකාශයෙහි යුක්තියුක්තභාවය පරීක්ෂා කරන්න.

(02 වන පිළිතුරේ සිට 10 වන පිළිතුර දක්වා සෑම පිළිතුරකටම ලකුණු 17 බැගිනි.)

******************************